"රාළහාමි ගිය ඉරිද පත්තරේ දැක්කද"

1937 තේ එක්තරා දිනයක, බොරළුගොඩ මහගෙදරට පිවිසි, හංවැල්ලේ පාසැල් ගුරුතුමා (ගුරුන්නාන්සේ මහත්තයා) තම මිත්‍ර බොරළුගොඩ රාළහාමිගෙන් විමසීය.

"නෑ මට තව කියවන්න බැරිවුණා" රාළහාමි පිලිතුරු දුන්නේය.

"එකේ කතෘ වාක්‍යයේ කියන හැටියට මේ සමසමාජය කියන්නේ අම්ම තාත්තට ගෞරවයක් නැති, ආගම ධමර්යක් පිළිගන්නේ නැති රටක් ජාතියකට ආදරේ නැති මහ භයානක ධමර්යක් කියලයි"

රාළහාමිගේ පුත් පිලිප් ගුණවර්ධන එවකට අවිස්සාවේල්ලේ රාජ්‍ය මන්ත්‍රී වරයාය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ, ලංකා ස.ස. පක්ෂය නියෝජනය කලේ පිලිප් ගුණවර්ධන හා ආචාර්ය එන්.එම්. පෙරේරා යන මන්ත්‍රීවරුන්ය.

බොරළුගොඩ රාලහාමි මොහොතක් සිය මිතුරා දෙස තියුණු ඇස් වලින් බලා, මෙසේ කිවේය.

***<u>සිය මන්ත්‍රී පුතාගේ කතාවෙන් පසු, විදනාරච්චි පියා කෙලින්ම ගියේ කොළඹ කච්චේරියටය. එහි ගිය ඔහු ලිපිකරුවෙකුගේ කඩදසියක් ඉල්ලාගෙන, සිය ඉල්ලා අස්වීමේ ලිපිය මිනිත්තු කිහිපයකින් ලියා අවසන් කළේය.</u>***

"ඒ කීම මං කොහොමත් පිළිගන්නේ නෑ"

"ඒ කියන්නේ රාළහාමි සමසමාජය කියන්නේ මොකද්ද කියල දන්නවද"

"නෑ මං දන්නේ නෑ" කෙටි පිළිතුරකි.

"එතකොට ? " එහෙනම්

"මේ ගුරුන්නාන්සේ මම සමසමාජය කියනනේ මොකද්ද කියල දන්නේ නෑ....හරි....ඒත් මම මගේ ලමයි ගැන දන්නව. රටට ජාතියට, ආගම ධර්මයට දෙමව්පියන්ට, සලකන්නේ නැති ධමර්යක් කවදවත් මගේ පුත්තු , පිලිප් , රොබට්, පිලිගන්නේ නෑ. ඔය පත්තරකාරයින්ට, ඕන කරල තියෙන්නේ හැමදමට ඒගොල්ලන්ගේ හාම්පුතාලව, ඒ කියන්නේ සුද්දන්ව, මේ රටේ රජකමට තියාගන්නයි. සුද්දන්ගෙන් රට නිදහස් කරගන්න ඕනයි කියන නිසා, ඔය ඔක්කොම බොරු බේගල් ඇද දමනව පත්තර කාරයෝ.

පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ (38 වැනි සංවත්සරය යෙදී ඇත්තේ මාර්තු 26 වනදටයි) පිලිප් ගුණවර්ධන චරිතය, පිළිබඳව දීර්ඝ විවේචනයක් කිරීම, කිසිම ලේඛකයෙකුට කළ නොහැකිය. ඒ සඳහා කාණ්ඩ කිහිපයකින් සමන්විත පොත් පෙලක් පලකල යුතුවේ. මේ අවස්ථාවේදී පිලිප් ගුණවර්ධන ගැන කතාකරනවාට වඩා, ඔහු සිය පියාණන් , අධිරාජ්‍ය විරෝධියකු කල අන්දම පිළිබඳව, සිද්ධීන් කිහිපයක් පමණක් පෙන්වා දීමට අදහස් කලෙමි.

බාරළුගොඩ රාලහාමි පොහෝ කාලයක් විදනාරච්චි පදවිය දැරුවේය. පුතා රාජ්‍ය මන්ත්‍රීවරයෙකු වු පසුද, ඔහුට විශ්‍රාම යාමට තව කලක් තිබුණි.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ, යෝජනාවක් ඉදිරි පත්කොට



# බොරළුගොඩ සිංහයා

මුලාදෑනි ක්‍රමය අහෝසි කළයුතු බව කියමින් කල වේගවත් කතාවට , සවන් දීමට, රාලහාමිද මන්ත්‍රණ සභා ගැලරියේ අසුන්ගෙන සිටියේය.

පුතා කතා කරයි.

"රදළ යුගයේ නෂ්ඨාවශේෂයක් වු මේ ක්‍රමය සම්පුර්ණයෙන් අහෝසි කර දැමිය යුතුය. රටේ මහත්තයාටත්, මුදලිටත්, විදන ආරච්චිට හා කෝරාලටත් මේ රටේ ජනතාව වාල් කරගෙන සුරාකන්නට තවදුරටත් ඉඩ



ගීතාංජන ගුණවර්ධන මහතා එස් පියසේන මහතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා

දෙන්නට බැහැ." සිය මන්ත්‍රී පුතාගේ කතාවෙන් පසු, විදනාරච්චි පියා කෙලින්ම ගියේ කොළඹ කච්චේරියටය. එහි ගිය ඔහු ලිපිකරුවෙකුගේ කඩදසියක් ඉල්වාගෙන, සිය ඉල්ලා අස්වීමේ ලිපිය මිනිත්තු කිහිපයකින් ලියා අවසන් කලේය. නීතිය අනුව, රජයේ ස්ථිර සේවකයෙක්, මාසයක් දැනුම් නොදී, ඉල්ලා අස්වේනම්, මාසයක වැටුප් රජයට ගෙවිය යුතුය. ඒ සඳහා චෙක්පත ලියන්නටද රාලහාමිට ගතවුයේ නිමේෂයකි.

1940 දී පිලිප් ගුණවධර්න , ආචාර්ය එන්.එම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්.ද.සිල්වා සහ එඩ්මන් සමරක්කොඩි, යන නායකයන් සිවු දෙනා යුද නීතිය යටතේ, අත්අඩංගුවට ගෙන සිර ගතකළ අන්දමත්, 1942 දී ඔවුන් සිර භාරයෙන් පැන, ගොස් ඉන්දියාවට ලගාවු අන්දමත් ඉතිහාසය ගතවී ඇත.

මේ පිරිස පලාගිය පසු, තවත් සමසමාජ නායකයන් රාශියක්, යුද නීතිය යටතේ අත්අඩංගුවට ගන්නා ලදී. පිලිප් ගේ සොයුරු රොබට් ද ඒ අතර විය.

බන්ධනාගාරයෙන් පලායාම නිසා පිලිප් ගුණවර්ධන හා එන්.එම්. පෙරේරා යන දෙදෙනාගේ රාජ්‍ය මන්ත්‍රණ අසුන් දෙකද අහෝසි වී ගියේය. ඒ අසුන් දෙක සඳහා, අතුරු මැතිවරණ පැවැත්විනි. අවිස්සාවේල්ල ආසනයට, තරඟ කලේ, පිලිප් ගුණවධ"නගේ වැඩිමල් සොයුරු හැරී ගුණවධ"න මහතාය. ඔහුට ආධාර කිරීම සඳහා, පැවැත්වුණු රැස්වීම්වල රැස්වීම් වලට සහභාගි වු, බොරළුගොඩ රාලහාමි, කථාකලේ වචන ස්වල්පයකි.



ආචාර්ය එන්.එම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්.ද.සිල්වා සහ එඩ්මන් සමරක්කොඩි

"මට පුත්තු තුන්දෙනයි. මද්දුම පුතා හිරේ දගෙන හිටිය. පැනල ගියා කියලා කියනවා. ජිවතුන් අතරද නැද්ද කියල මම දන්නේ නෑ. බාල පුතත්, දැන් හිරේට අරගෙන, දුක් විදිනවා ඒ පුත්තු කවදවත්, අපරාධ කරල නෑ. එකම අපරාදේ මේ රට ඉංග්‍රිසිංගෙන් නිදහස් කරගන්න ඕන කියපු එක විතරයි. දැන් වැඩිමල් පුතත් ඔය අදහස්ම ඉදිරිපත් කරන්න, මන්ත්‍රණ සභාවට යන්න ඕනයි කියනවා. මම කියනව ඉතිං යන්න කියල"

1947 පාර්ලිමේන්තු මැතිවරණයේදී, අවිස්සාවේල්ල හා කෝට්ටේ යන ආසන දෙකම පිලිප් හා රොබට් යන පුතුන් දෙදෙනා ජයගන්නා විට බොරළුගොඩ රාලහාමි සිටියේ ලෙඩ ඇදේය. එම ජයග්‍රහණයෙන් ටික දිනකට පසු ඔහු අභාවප්‍රාප්ත විය.

පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වී මාස තුනක් ගතවීමත් සමඟ, ඔවුන් වෙස්ටර්න් බස් සමාගමේ වැඩ වර්ජනයේ සිදුවු සිද්ධියක් සම්බන්ධයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රී පිලිප් ගුණවර්ධන මහතාට විරුද්ධව නඩු පවරා ඔහු බන්ධනාගාර ගත කරන ලදී. ආසනය රැකගැනීම සඳහා, ආණ්ඩුකාරවරයාගෙන්, සමාවක් ඉල්ලන ලෙස, ඔහුට මිත්‍ර මන්ත්‍රීවරු ඉල්ලා සිටියහ. එය ප්‍රතික්ෂේප කල පිලිප්, බන්ධනාගාරයට ගියේය. ඔහුට පමණක් නොව, අවු. 7කට ඡන්ද බලයද අහිමි විය. අධිරාජ්‍යවාදී ආණ්ඩුකාරයාගෙන් නොව, නිදහස් වු ලංකාවේ අග්‍රාමාත්‍යවරයාගේ මාර්ගයෙන් සමාවක් ඉල්ලා මන්ත්‍රිකම රැකගැනීමට, ඔහු සුදනම් නොවිය. අසුන අහිමි විය. අතුරු මන්ත්‍රීවරණයක් ප්‍රකාශයට පත්කරන ලදී. පිලිප්ගේ බිරිඳ කුසුමා එම මැතිවරණයට ඉදිරිපත් වු අවස්ථාවේ ඈ සමඟ තරඟ කිරීමට , කිසිවෙකු ඉදිරිපත් නොවීම නිසා, නිතරඟයෙන් පත්වු කුසුමා සැහෙන කාලයක් මන්ත්‍රී ධුරය දැරිය.

පිලිප් විවිධ රජයන් යටතේ ඇමතිධුර කිහිපයක් දැරීය. ඔහු මන්ත්‍රීවරයෙක් වනවිට පියාගෙන් ලැබුණු සෑහෙන දේපලක් ඔහුට විය. ඔහුගේ බිරිඳ ද මන්ත්‍රී ධුරයක් දැරුවාය. එහෙත් සිය පියාගෙන් උරුම වු බොහෝ දේ මියයන විට ඔහුට අහිමි වී තිබුණි. ලිපිය අවසාන කිරීමට පෙර, එක් අනුවේදනීය සිද්ධියක් සඳහන් කල යුතුය.

1977, වර්ෂයේ එක්තරා දිනක මහරගම බලායාම සඳහා, අවිස්සාවේල්ල බලායන බස් රථයකට පිටකොටුවෙන් ගොඩ වී "තිඹිරිගස් යායේදී, සුදු සාරියක් ඇඳගත් කාන්තාවක් බස් රථයට ගොඩ වී, බොරළුගොඩ යයි කොන්දෙස්තරට කියන ඇසී, හැරී බැළුවෙමි. මට දකින්නට ලැබුනේ අවු : 10ටත් වඩා රටේ ඇමතිකම් දැරූ ප්‍රභූවරයෙකුගේ බිරිඳ වුද අවු: 15 ක් තමාත් පාර්ලිමේන්ත මන්ත්‍රී ධුරය දැරුවාවුද, කුසුමා ගුණවර්ධන මහත්මියයි.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදි
ඇස්.පියසේන




